# බුද්ධානුස්සති භාවනාව

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සියලු රාග, ද්වේෂ, මෝහ දුරු කළ සේක. සියලු කුසල් දහම් දියුණු කළ සේක. උතුම් සමාධිය දියුණු කළ සේක. ආශ්චර්යවත් වූ ප්‍රඥාවක් ඇති කරගත් සේක. සියලු කෙලෙසුන් කෙරෙන් නිදහස් වුන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ ඇසින් රූප දැක ඒ රූප කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුළා නොවුන සේක, ආශාව දුරු කළ සේක. කනින් ශබ්ද අසා ඒ ශබ්ද කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුළා නොවුන සේක, ආශාව දුරු කළ සේක. නාසයෙන් ගඳ සුවඳ දැන ඒ ගඳ සුවඳ කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුළා නොවුන සේක, ආශාව දුරු කළ සේක. දිවෙන් රස විඳ ඒ රසය කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුළා නොවුන සේක, ආශාව දුරු කළ සේක. කයින් පහස ලබා ඒ පහස කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුළා නොවුන සේක, ආශාව දුරු කළ සේක. මනසින් අරමුණු සිතා ඒ අරමුණු කෙරෙහි කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුළා නොවුන සේක, ආශාව දුරු කළ සේක.

බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ **අරහං** වන සේක, **අරහං** වන සේක, **අරහං** වන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අවබෝධ කළ යුතු වූ, දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් අවබෝධ කොට වදාළ සේක. ප්‍රහාණය කළ යුතු වූ දුකේ හටගැනීම නම් වූ ආර්ය සත්‍යය, පරිපූර්ණ වශයෙන් ම ප්‍රහාණය කොට වදාළ සේක. සාක්ෂාත් කළ යුතු වූ දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය, පරිපූර්ණ වශයෙන් ම සාක්ෂාත් කොට වදාළ සේක. ප්‍රගුණ කළයුතු වූ දුක් නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය, පරිපූර්ණ වශයෙන් ම ප්‍රගුණකොට වදාළ සේක. මේ චතුරාර්ය සත්‍යය ධර්මයන් සත්‍ය ඥාණ වශයෙන් ද, කෘත්‍ය ඥාණ වශයෙන් ද, කෘත ඥාණ වශයෙන් ද පරිවර්ත තුනකින් යුතුව ආකාර දොළොසකින් යුතුව, පරිපූර්ණ වශයෙන් ගුරු උපදේශ රහිතව අවබෝධ කොට වදාළ නිසා **සම්මාසම්බුද්ධ** වන සේක. බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන් ම **සම්මාසම්බුද්ධ** වන සේක, **සම්මාසම්බුද්ධ** වන සේක, **සම්මාසම්බුද්ධ** වන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සෘද්ධි බල ඥාණ ලබාගත් සේක. ඕනෑම දෙයකට සවන් දිය හැකි දිව්‍ය ශ්‍රවණ ඥාණ ලබාගත් සේක. ඕනෑම දෙයක් දැකිය හැකි දිව්‍ය නේත්‍ර ඥාණ ලබාගත් සේක. ඕනෑම කෙනෙකුගේ සිත් දකින්නා වූ අනුන්ගේ සිත් දන්නා ඥාණ ලබාගත් සේක. ඕනෑම කෙනෙකුගේ සිතක ඇති වාසනා ගුණ දැකීමේ හැකියාව වූ ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥාණය ලබාගත් සේක. ඕනෑම කෙනෙකු සසර ගෙවූ ආකාරය දැකීම නම් වූ පුබ්බේනිවාසානුස්සති ඥාණය ලබාගත් සේක. ඕනෑම කෙනෙක් කර්මානුරූපව චුතවෙන ආකාරය ද, කර්මානුරූපව උපදින ආකාරය ද දැකීමේ ඥාණය, චුතූපපාත ඥාණය ලබාගත් සේක. ඔබ වහන්සේ තුළ පැවති සියලු කෙලෙසුන් නැතිකොට නිකෙලෙස් බව දන්නා වූ ආසවක්ඛය ඥාණය ලබාගත් සේක.

බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ, ඒ ඥාණයන්ට අනුව ම ජීවිතය ගතකළ සේක. අනන්ත සිල් ඇතිව ජීවිතය ගතකළ සේක. මනා සංවරයෙන් ජීවිතය ගතකළ සේක. හැම ක්ෂණයෙහි ම හැම මොහොතෙහි ම ඉතා සිහියෙන් යුතුව ජීවිතය ගතකළ සේක. අප්‍රමාණ වීරියෙන් යුතුව ජීවිතය ගතකළ සේක. අටලෝ දහමට කම්පා නොවී ජීවිතය ගතකළ සේක. ඉතා බලවත් වූ සමාධි සමාපත්තියෙන් යුතුව වැඩසිටි සේක. අනන්ත විමුක්තිය ඇති සිතින් ගතකළ සේක. බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන් ම **විජ්ජාචරණ සම්පන්න** වන සේක. **විජ්ජාචරණ සම්පන්න** වන සේක. **විජ්ජාචරණ සම්පන්න** වන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අවබෝධ කොට වදාළ ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වූ ඒ මධ්‍යම ප්‍රතිපදාව ඒකාන්තයෙන් ම සුන්දරයි. ඒ සුන්දර වූ මධ්‍යම ප්‍රතිපදාව තුළ

තම ජීවිතය දියුණු කොට ඒ අමා නිවන වූ, පරම සුන්දර නිවන සාක්ෂාත් කොට වදාළ නිසා, බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන් ම **සුගත** වන සේක. **සුගත** වන සේක. **සුගත** වන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සියලු බ්‍රහ්මලෝක ද, සියලු දිව්‍යලෝක ද, මේ මිනිස් ලෝකය ද, සතර අපාය ආදී සියලු ලෝකයන්ගේ යථා ස්වභාවය අවබෝධ කරගෙන මේ සියලු ලෝකවලින් නිදහස් වී වදාළ නිසා බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන් ම **ලෝකවිදූ** වන සේක, **ලෝකවිදූ** වන සේක, **ලෝකවිදූ** වන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ දමනය කිරීමට නොහැකි වූ අකීකරු දෙවියන්ව ද, අකීකරු බඹුන්ව ද, අකීකරු මිනිසුන්ව ද මහා කරුණාවෙන් දමනය කොට, මහා ප්‍රඥාවෙන් දමනය කොට, ඉර්ධි ප්‍රාතිහාර්යයෙන් දමනය කොට, දහමට කීකරු කරවා අමා නිවනට පමුණුවා වදාළ නිසා බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන් ම **අනුත්තරෝ පුරිසදම්මසාරථී** වන සේක, **අනුත්තරෝ පුරිසදම්මසාරථී** වන සේක, **අනුත්තරෝ පුරිසදම්මසාරථී** වන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ දෙව්ලොව දෙවියන්ගේ ද, මනුලොව මිනිසුන්ගේ ද එකම ශාස්තෘන් වහන්සේ වන සේක. බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන් ම **සත්ථා දේවමනුස්සානං** වන සේක, **සත්ථා දේවමනුස්සානං** වන සේක, **සත්ථා දේවමනුස්සානං** වන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අවබෝධ කොට වදාළ ඒ උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය අන් අයට ද අවබෝධ කරගැනීම පිණිස ඉතා පැහැදිලි ලෙස, ඉතා සුන්දර ලෙස, පැහැදිලි වචනවලින්, පැහැදිලි අර්ථවලින් දේශනා කොට වදාළ නිසා බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන් ම **බුද්ධ** වන සේක, **බුද්ධ** වන සේක, **බුද්ධ** වන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ලොවේ වෙන කිසිවෙකුට නොදැරිය හැකි මේ උතුම් සම්බුදු ගුණයන් ඔබ වහන්සේ දරා වැඩ සිටි නිසා භාග්‍යවන්ත වන සේක. ලොවේ වෙන කිසිවෙකුට නැති ආශ්චර්යවත් වූ ප්‍රඥාවකින් වැඩ සිටි නිසා භාග්‍යවත් වූ සේක. ලොවේ වෙන කිසිවෙකුට නැති මහා කරුණාවෙන් සිසිල් වී ගිය හද මඬලක් ඇති නිසා භාග්‍යවන්ත වන සේක. බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන් ම **භගවා** වන සේක, **භගවා** වන සේක, **භගවා** වන සේක.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මගේ මේ පුංචි හිතට ඔබ වහන්සේගේ ගුණ කඳ අනන්තයි අප්‍රමාණයි, බුදුගුණ අනන්තයි අප්‍රමාණයි.

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඒ බුදුගුණ අනන්තයි. අප්‍රමාණයි. බුදුගුණ අනන්තයි... බුදුගුණ අනන්තයි... බුදුගුණ අනන්තයි...

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ, මම සරණ ගිය, එකම ශාස්තෘන් වහන්සේ වන සේක, බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ මම සරණ ගිය එකම ශාස්තෘන් වහන්සේ වන සේක. බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ මම සරණ ගිය එකම ශාස්තෘන් වහන්සේ වන සේක. මාගේ ජීවිතය වැනසී ගියද, මම වනාහී කිසිම දිනයක නිවන් දකිනා මොහොත දක්වා ඔබ වහන්සේගෙන් බැහැරට නොයමි. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මාගේ ජීවිතයට එකම ආලෝකය වන සේක. එකම පිළිසරණ වන සේක, එකම සැනසිල්ල වන සේක, එකම සැනසිල්ල වන සේක, ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මම වනාහී ඔබ වහන්සේ සරණ ගිය ඔබ වහන්සේගේ ශ්‍රාවකයා වෙමි. මම කිසිත් නොදනිමි. ඔබ වහන්සේ මාගේ ජීවිතය ගැන, සියලු දෙය දන්නා සේක. මාගේ ජීවිතයට සැනසිල්ල වන සේක, සැනසිල්ල වන සේක, සැනසිල්ල වන සේක.

සාදු! සාදු!! සාදු!!!